සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 16 S I

# ඉස්ලාම් I

කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**

* සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවල ①②③④ යන අංක යෙදූ පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.
* ඔබට ලබා දී ඇති පිළිතුරු පතෙහි සෑම ප්‍රශ්නයක් සඳහා වන කවය තුලින් ඔබගේ පිළිතුරු අංකය සහිත කවයෙහි ( X ) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයෙහි පසු පිටෙහි ලබා දී ඇති අනෙකුත් උපදෙස් ද හොඳින් කියවා පිළිපදින්න.

01. ඉස්ලාමීය අකීදාවේ "අස්සම්ඉය්යාත්" යනු,
1. අල්ලාහ් පිළිබඳ කරුණු
2. නබිවරුන් පිළිබඳ කරුණු
3. මලාඉකාවරුන් පිළිබඳ කරුණු
4. පරලොව පිළිබඳ කරුණු

02. කුල්ලතෙන් ප්‍රමාණයට වඩා අඩු ඉතා පිරිසිදු ජලයෙහි නජීස් මිශ්‍ර වී එහි පාට, සුවඳ, රස යන කරුණු වලින් එකක් හෝ වෙනස් වී ඇති විට එම ජලය හඳුන්වනු ලබන නම,
1. අල්මාඋත් තහූර්
2. අල්මාඋත් තාහිර්
3. අල්මාඋන් මුතනජ්ජිස්
4. අල්මාඋල් මුස්තඃමල්

03. ඉල්හාද් යනු,
1. ආගම වෙනස් කිරීම.
2. දේව මඟපෙන්වීම ප්‍රතික්ෂේප කිරීම.
3. අල්ලාහ්ගේ මැවීමකට නැමදුම් කිරීම.
4. මුකස්දුති

04. නබි මුහම්මද් (සල්) තුමාගේ නාමයක් නොවන්නේ,
1. මාහි
2. හාෂිර්
3. කාදිර්
4. ආකිබ්

05. Z සකාත් ලැබීමට සුදුසු අයවලුන්ගෙන් සාධාරණ හේතුවක් සඳහා ණය වී එම ණය ආපසු ගෙවීමට නොහැකි අය,
1. කාරිමුන්
2. රිකාබ්
3. ආමිල්
4. ඉබ්නු සබීල්

06. අප සියළු දෙනා සලාතයේදී "ඉඃදිනස් සිරාතල් මුස්තකීම්" යනුවෙන් පාරායණය කරන්නෙමු මෙහි අර්ථය,
1. ඔබගෙන්ම උදවු පතමු.
2. ඔබ අපට යහමාර්ගය පෙන්වනු මැනවි.
3. ඔබ අපරිමිත දයාවන්තයාය.
4. ඔබටම නමදිමු.

07. හජ් හි වාජිබ් වලින් එකකි.
1. තල්බියා පාරායණය කිරීම.
2. තවාෆුල් විදා ඉටු කිරීම.
3. සඊ කිරීම
4. තවාෆුල් ඉෆාලා ඉටු කිරීම.

08. නබි (සල්) තුමා කඃබාවෙහි තබා තිබූ සියළු පිළිම ඉවත් කර එහි ඒකීයත්වය පිහිටවනු ලැබූ වර්ෂය,
1. හිජ්රි 4
2. හිජ්රි 6
3. හිජ්රි 8
4. හිජ්රි 10

09. කුරුස වීරයන්ගෙන් මස්ජිදුල් අක්සාව මුදවා ගත් සේනාධිපතියා,
1. උමර් (රලි)
2. කාලිද් ඉබ්නු වලීද් (රලි)
3. සුල්තාන් නුරුද්දීන්
4. සලාහුද්දීන් අයියූබි

10. පහත "අ" තීරුවේ වචන කිහිපයකුත් "ආ" තීරුවේ වචන කිහිපයකුත් ලබා දී ඇත. එකිනෙක ගැලපීමේදී නිවැරදි පිළිතුර,

| "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|
| 1. අල් මඃරිෆා | (A) තෘප්තියට පත්වීම. |
| 2. අර් රිලා | (B) පිළිවෙත් සුරැකීම. |
| 3. තස්කියා | (C) දැනුම. |
| 4. වරඋ | (D) පාරිශුද්ධ කිරීම |

1. C,A,B,D
2. B,C,A,D
3. A,B,C,D
4. C,A,D,B

11. පහත සඳහන් වදන් වලින් යහගුණාංග පිළිබඳ කියැවෙන වදනක් නොවන්නේ,
1. ජිනායාත් 2. ආදාබ් 3. අඛ්ලාක් 4. සුලූක්

12. "සබ්ර්" යනු,
1. ධෛර්යය 2. යටහත් බව 3. ඉවසීම 4. ආඩම්බරකම

13. විනාශ වන සුළු මෙලොව ජීවිතය හඳුන්වන්නේ,
1. දාරුල් බකා 2. දාරුල් ෆනා 3. දාරුල් මකාම් 4. දාරුල් කුල්ද්

14. පහත සඳහන් දේවල් අතුරින් වඩාත් සමාන අදහස් ලබා දෙන පද යුගලය,
1. දුන්යා - ආඛිරා
2. කල්බුන් සලීම් - කල්බුන් මුත්ම ඉන්නා
3. මුජ්තහිද් - මුකල්ලිද්
4. මද්රසතුල් අසර් - මද්රසතුල් ර: යු

15. අල් කුර්ආනයේ පවසා ඇති ආකාරයට කිරුම් මිනුම් වලදී වංචා කරන අය ගතවන අපාය,
1. ජහන්නම් 2. නාර් 3. සකර් 4. වෛල්

16. "අස්හාබුස්සුෆ්ෆා" යනුවෙන් හඳුන්වනු ලැබූවෝ,
1. ආගමක් ඇත්තාවුන්
2. නබිතුමාගේ පවුලේ උදවිය
3. ගෙපිළ මිතුරන්
4. වහී ලියූ අය

17. අල්කුර්ආනයේ සුන්නාහ් ව හැඳින්වීමට භාවිතා කර ඇති පදය,
1. හුදා 2. හික්මා 3. නූරුන් 4. කිතාබ්

18. ඉමාම් අබුදාවුද් (රහ්) තුමාගේ මුල් නම,
1. සුලෛමාන් 2. මුහම්මදු 3. අහමද් 4. ඉද්රීස්

19. අබුබක්කර් (රළි) තුමා ඉස්ලාමීය රාජ්‍යයේ නායකත්වය භාර ගත් හිජ්රි වර්ෂය,
1. 10 2. 11 3. 13 4. 14

20. "කවරෙකු අප සලාතය ඉටු කළ ආකාරයට ඉටු කරයිද, අපගේ කිබ්ලාව පෙරටු කර ගන්නේද, අප විසින් ගෙල සිඳින ලද දේ අනුභව කරන්නේද, ඔහු අපට අයත් කෙනෙකි." මෙය,
1. අල්කුර්ආන් වැකියකි.
2. හදීස් වැකියකි.
3. උමර් (රළි) තුමා විසින් පැවසූවකි.
4. උස්මාන් (රළි) විසින් පැවසූවකි.

21. පහත "අ" තීරුවේ කර්තෘවරුන් කිහිපදෙනෙකුගේ නම් ද "ආ" තීරුවේ ඔවුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ කිහිපයක නම් ද දැක්වේ.

| "අ" | "ආ" |
|---|---|
| 1. ඉමාම් මාලික් (රහ්) | (A) ෆුතුහුල් බුල්දාන් |
| 2. ඉමාම් ෂාෆීඊ (රහ්) | (B) අජා ඉබුල් හින්ද් |
| 3. අල් බලාදුරි (රහ්) | (C) මුවත්තා |
| 4. ඉබ්නු ෂහ්රායාර් | (D) අර්රිසාලා |

ඉහත "ආ" තීරුවේ ග්‍රන්ථ වල නම් "අ" තීරුවේ කර්තෘවරුන් සමග පිළිවෙලට සකස් කළ විට ලැබෙන පිළිතුර,
1. CABD 2. DCAB 3. CDAB 4. CBDA

22. "අසදුල්ලාහ්" යනුවෙන් නබි (සල්) තුමන් විසින් ප්‍රශංසා කරනු ලැබූ නබි මිතුරා,
1. කාලිද් ඉබ්නු වලීද් (රළි) 2. තල්හා (රළි) 3. උමර් (රළි) 4. අලි (රළි)

23. ජාහිලියා කාලයේ ආදේශ කිරීම් වල නිරත නොවූවන්,
1. හනීෆ් 2. ෂකීබ් 3. කබීලා 4. මජූසි

24. හූනියම්කරුවන්ට විරුද්ධව තමා ලද ආශ්චර්‍යය එළි දැක්වූ නබි වරයා,
1. දාවුද් (අලෛ) 2. ඊසා (අලෛ) 3. මූසා (අලෛ) 4. මුහම්මද් (සල්)

25. උපවාසයේ යෙදීමට තහනම් වූ දිනයක් වන්නේ,
1. ෂඃබාන් මස පළමු දින
2. ෂව්වාල් මස පළමු දින
3. මුහර්රම් මස දහවන දින
4. දුල්හජ් මස නවවන දින

26. සින්ධු ප්‍රදේශය මුස්ලිම්වරුන් විසින් ජය ගත් වසර,
1. ක්‍රි.ව. 661 2. ක්‍රි.ව. 715 3. ක්‍රි.ව. 1258 4. ක්‍රි.ව. 1458

27. ශ්‍රී ලංකාවට පිටුවහල් කරන ලද විප්ලවාදී වීරයකු වන ඔරාබි පාෂා ගේ මව් රට,
1. සවුදි අරාබිය. 2. යෙමන්. 3. ඉරානය. 4. ඊජිප්තුව

28. "වෙළඳාම සම්බන්ධ ආගමික නීති දන්නා අය පමණක් අපගේ කඩ වීදි වල විකුණුම් හා ගැණුම් කටයුතු වල යෙදිය යුතුයි. නීතිය නොදන්නන් වෙළඳපොළට නොපැමිණිය යුතු යි යනුවෙන් පැවසුවේ,
1. උමර් (රළි) 2. අලි (රළි)
3. උස්මාන් (රළි) 4. කලීෆා උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්)

29. විවාහයේදී "වලී" යනු,
1. සාක්ෂි 2. මනමාලයාගේ භාරකරු
3. මනමාලියගේ භාරකරු 4. නීතිපති

30. බිරිඳ ස්වාමි පුරුෂයාගෙන් විවාහ බන්ධනයෙන් නිදහස ඉල්ලීම,
1. තලාක් 2. ෆස්කු 3. කුල් උ 4. ලිහාර්

31. ඉද්දා රකින භාර්යාවට ලබා දෙන නඩත්තු මුදල හඳුන්වන්නේ,
1. මහර් 2. නෆකා 3. කිස්වා 4. සදකා

32. මුස්ලිම්වරයෙකුගේ ජීවිතය පිළිබඳ පහත සඳහන් කියමන් අතුරින් වඩාත් නිවැරදි වන්නේ,
1. මෙලොව ජීවිතය ප්‍රතික්ෂේප කර පරලොව ඉලක්ක කර ජීවත් විය යුතුය.
2. මෙලොව ජීවිතය පමණක් ඉලක්ක කර ගැනීම.
3. මෙලොව ජීවිතය පරීක්ෂාවක් සඳහාය යන අදහසින් බැලීම.
4. මෙලොව ජීවිතය හා පරලොව ජීවිතය වෙන්කොට එදෙස බැලීම.

33. නබි (සල්) තුමාගේ ඉල්ලීම මත කාෆිර්වරුන්ට විරුද්ධව කවි ගායනා කල නබි මිතුරා,
1. සෙයිද් ඉබ්නු සාබිත් (රළි) 2. කඃෆ් ඉබ්නු මාලික් (රළි)
3. සඅද් ඉබ්නු අබී වක්කාස් (රළි) 4. අමීර් ඉබ්නු ආස් (රළි)

34. ජාහිලියා කාලයේදී දක්නට ලැබුණු එක් වෙළඳපොළකි,
1. මඃදනා 2. දීවාන් 3. ලිවාන් 4. උක්කාල්

35. "නබිවරුන්ගේ පියා" යන ගෞරව නාමයෙන් අමතනු ලබන නබිවරයා,
1. ආදම් (අලෛ) 2. නූහ් (අලෛ) 3. ඉබ්රාහීම් (අලෛ) 4. යඃකූබ් (අලෛ)

36. වරදක් සිදුවේදෝයි බියෙන් වරදක් නොවන දෙයක් අත්හැරීම,
1. වරඋ 2. තවක්කුල් 3. කව්ෆ් 4. රජාඋ

37. නබි (සල්) තුමා දුආ ප්‍රාර්ථනාව ශරීරයේ කුමන අවයවයට සමාන කර ඇත්තේ ද?
1. හදවත 2. ඇස් 3. කන් 4. මොළය

38. ඉස්ලාම් ලබා දී ඇති මානව අයිතිවාසිකම් පිළිබඳ පවසන්නේ,
1. පළමු අකබා ගිවිසුම 2. දෙවන අකබා ගිවිසුම
3. හුදෛබියා 4. මදිනා සම්මුතිය

39. අල්කුර්ආනය සමඟ සම්බන්ධතාවයක් නොදක්වන පදයකි.
1. මුස්හබ් 2. මුෆස්සිර් 3. මුස්නද් 4. කාරී

40. ආගමික ගැටළුවකදී මුජ්තහීද්වරුන්ගේ වැඩි දෙනෙකු එක් විසඳුමකට එකඟවීම හඟවන පදය,
1. ඉජ්මාඋල් සරිහ් 2. ඉජ්මාඋල් අක්සරීය්‍යා
3. ඉජ්මාඋල් කව්ලි 4. ඉජ්මාඋල් සුකුති

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 16 S II |
|---|---|---|

## ඉස්ලාම් II

කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**
* පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
* පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද අනෙකුත් ප්‍රශ්න වලට ලකුණු 10ක් ද ලබා දෙනු ලැබේ.

**01.** කෙටි පිළිතුරු සපයන්න.
- **i.** ෂියාවරුන් බිහිවීමට බලපෑ හේතුව කුමක්ද?
- **ii.** උපවාසයේ නිරත වීමෙන් නිදහස ලැබූවන් දෙදෙනෙකු නම් කරන්න.
- **iii.** ව්‍යාජ නබිවරයෙකුව පෙනී සිට පසුව ඉස්ලාමය වැළඳගෙන නහර්වාන් යුද්ධයේදී ෂහීද් වූයේ කවුද?
- **iv.** සකාතයේ ෆර්ලු ලියන්න.
- **v.** මුඃජිසාත් යනු කුමක්ද?
- **vi.** තලාක් රජඊ යනු කුමක්ද?
- **vii.** අලි (රළි) තුමා කෙරෙහි දක්නට ලැබුණු පෞරුෂ ලක්ෂණ දෙකක් ලියන්න.
- **viii.** ෆික්හුල් අව්ලවිය්යාත් යනු කුමක්ද?
- **ix.** "උල්හිය්යා" යනු කුමක්ද?
- **x.** ඉස්ලාමීය කාන්තාවකගේ අව්රතය කුමක්ද?

**02.**
- **i.** "තව්හිද්" යනු කුමක්ද?
- **ii.** කුෆ්ර් ඇති වන ක්‍රම මොනවාද?
- **iii.** ඉස්ලාමය අතහැර ගිය "මුර්තද්" සම්බන්ධ ඉස්ලාමීය නීතිය කුමක්ද?

**03.**
- **i.** උපවාසයේ සුන්නත් හතරක් ලියන්න.
- **ii.** Z සකාත් අනිවාර්ය වන ද්‍රව්‍ය තුනක නම් ලියන්න.
- **iii.** හජ් ඉටු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.

**04.**
- **i.** "ඉජ්තිහාද්" යනු කුමක්ද?
- **ii.** ඉජ්තිහාද් කිරීමට නබි (සල්) තුමා අවසර ලබා දී ඇත. මෙය සාධකයක් සහිතව සනාථ කරන්න.
- **iii.** කියාස් හි අර්කාන් පැහැදිලි කරන්න.

**05.**
- **i.** කලීෆා අබුබක්කර් (රළි) තුමාගේ පාලන කාලයේ මුහුණ පෑ අභියෝග දෙකක් ලියන්න.
- **ii.** කලීෆා උමර් (රළි) විසින් හඳුන්වා දෙන ලද නව සංවිධානාත්මක ක්‍රම තුනක් ලියන්න.
- **iii.** කලීෆා උස්මාන් (රළි) තුමා විසින් ඉටු කරන ලද සේවාවන් පහක් ලියන්න.

**06.**
- **i.** හවුල් ව්‍යාපාරයකින් ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න.
- **ii.** ධනෝපායන ක්‍රියාකාරකම් හා සම්බන්ධ මූළාරඹා හි වැදගත්කම පහදන්න.
- **iii.** ඉස්ලාම් තහනම් කර ඇති ඉපැයීම් ක්‍රම පහක් ලියන්න.

**07.** පහත සඳහන් දේවල් අතරින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
- **i.** ඉස්ලාමීය ෂරීආවට අනුව විවාහයේ අරමුණු
- **ii.** ආදර්ශමත් මුස්ලිම් පවුලක් සතු ගුණාංග
- **iii.** මාධ්‍යයන් සුරැකිය යුතු ගුණාංග
- **iv.** "උම්මත්" වශයෙන් ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් වෙත තිබිය යුතු වැදගත් ගුණාංග.


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440